සඳැස් නිසඳැස්

තාරක ශ්‍රී කාන්ත

සඳැස් නිසඳැස්

තාරක ශ්‍රී කාන්ත

සඳැස් නිසඳැස්

ISBN: 978-955-38808-0-2

© තාරක ශ්‍රී කාන්ත

ප්‍රථම මුද්‍රණය: - 2017 දෙසැම්බර්

කවර නිර්මාණය සහ ඇතුළු පිටු සැකසුම
නදීකා දිල්හානි

මුද්‍රණය
අනුර ප්‍රින්ටර්ස්, නුවර පාර, කුරුණෑගල.
ටෙලි: 0372221198
Email: anuraprinters@gmail.com

කර්තෘ ප්‍රකාශනයකි.

කර්තෘගේ ලිඛිත අවසරයක් නොමැතිව මෙම පොතෙහි කිසිවක්
උපුටා පලකිරීම තහනම්.

පිදුම

හැඟුම් කවි	කොට
කවි පොතක්	කොට
කවි ප්‍රිය	ඔබට
පුදමි සෙනෙහස් සිතින්	මෙලෙසට

කර්තෘගේ වෙනත් කෘති

ගුප්ත කරුණු
සහ
ග්‍රහ, රාශි, භාව විස්තර

තුති පිදුම

පොල්ගහවෙල පරාක්‍රමබාහු ජාතික පාසලේ සුන්දර පරිසරය නිසාත්, මට උසස් පෙළදී සිංහල විෂය ඉගැන්වූ ඒ. චන්ද්‍රසේන ගුරුපියාණන්ගේ ඉගැන්වීම් රටාව නිසාත්, මාගේ අතින් කවි ලිවීම ඇරඹෙන්නට ඇතැයි සිතමි. එබැවින් පොල්ගහවෙල පරාක්‍රමබාහු ජාතික පාසලේ සුන්දර පරිසරයටත්, මට ශිල්ප ඉගැන්වූ ඒ.චන්ද්‍රසේන ගුරු පියාණන්ටත් මාගේ හදපිරි ආදර ගෞරව ස්තුතිය පිරිනමමි.

මේ පොත සැකසීමේ දී මට නන් අයුරින් සහාය ලබා දුන් ඒ.චන්ද්‍රසේන මහතා, හිල්ඩා ගුණවතී මහත්මිය, චාමර ප්‍රභාෂ් සමරනායක මහතා, ඉෂාන් සංකල්ප මහතා, ඉන්දික ප්‍රභාත් මහතා ඇතුලු සියලු දෙනාටත්, කුරුණෑගල අනුර ප්‍රින්ටර්ස් ආයතනයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, නම් සඳහන් නොකලත් මට නන් අයුරින් සහාය ලබාදුන් සියලු දෙනාටත් මාගේ හදපිරි ආදර ගෞරව ස්තුතිය පිරිනමමි.

තාරක ශ්‍රී කාන්ත,
නො. 196/5,
කෑගල්ල පාර,
පොල්ගහවෙල.
ටෙලි: 071 6489525

පටුන

දෙවියෝ 09
පියරජතුමා 10
අම්මා 11
නිවාඩුව 12
අපේ සර් 13
ආදර අරුත 14
ආදර ආකල්ප 15
හීන්නගා 16
කවුද ඔබ 17
දිව ඔසුව 18
සැසඳීම 19
කිවනොහැකි ආදරය 20
කළුෑ 21
දඹුලුගල වැනුම 22
සරසවි පෙම 23
තනිවුන විට 24-25
දුක නිර්විින්දනය වීම 26
ගුවනට නැගි පෙම 27
බොරු 28
පල්හිනාව 29
කන්නලව්ව 30
කලක ඇවෑමෙන් 31
උදහස් නොමවෙන් 32
හාමිනේ නෑගම් ගියා 33
මචං 34
රාවණා දෙවියෝ 35
රාවණා රජතුමා 36
ජන මෙහෙවර 37
පුලස්ති සෘෂිතුමා 38
ඉතිහාසය 39

තෘප්තිය 40
රස විඳීම 41
මේකප් 42
කලාව 43
අගය 44
ස්වභාවික සංගීතය 45
නීට් එක 46
ඔබ විශිෂ්ටයි 47
මිනිස්සු 48
උයමන 49
සියපත 50
ඉල්ලීම 51-52
ඇමතිතුමන් වෙත 53
පෙර මඟ නිමිති 54
හිස්ටීරියාව 55
ක්ෂණික කෝපය 56
යොමුවීම 57
අභිභවා යෑම 58-59
ලදදෙයින් දුක්වීම සහ ලදදෙයින් තුටු වීම 60
අනිත්‍යයේ සැප දුක 61
කුල උච්ච මානය සහ කුල හීන මානය 62
සුන්දර අසුන්දර 63
නොදුන් අයිතිය 64
මගේමද 65
මටමද 66
සිත් අහස 67
දුකගේන සිතිවිල්ල 68
සසර දුක 69
ජය ශ්‍රී මහා බෝධිය 70
මොණරාගල සමාධි පිළිමය 71
අන්තිම කැමැත්ත 72

01.

දෙවියෝ

ධනලක්ෂ්මී මෑණිවැන්දා සැමට ධනය ලැබෙන්න
සරස්වතී මෑණිවැන්දා කලාවෙ රස ලැබෙන්න
ගණදෙවියන් වැන්දා මං සැමට නුවණ ලැබෙන්න
සැම දෙවියෝ පිහිට වේවා සැමටම සෙත් ලැබෙන්න

02.

පියරජතුමා

දැණුනා දැණුනා
ඔබෙ ගුණ දැණුනා
ඔබේ සුවඳ මට තව තව දැණුනා
පිය පදවිය ලද දා
මා පියපදවිය ලද දා

මා පුතු උගතෙක්
වියතෙක් කෙරුමට
කරණා අතරේ මං අද වෑයම්
නැගුනා සිහියට ඔබ මා උගතෙක්
වියතෙක් කෙරුමට ගත් වී වෑයම්
ආදර පියාණනේ
මා ආදර පියාණනේ

ගැමුණු කුමරුහට ජයලැබ ගන්නට
පිය රජු රහසින් ගෙන ඇති වෑයම්
නැගුනා සිහියට මා පිය රජුනේ
දුටුවම දිරිදුන් සෙනෙහස රහසින්
දුටුවම දිරිදුන් සෙනෙහස රහසින්

03.

අම්මා

සුවදේ සුවදේ
එනවිට අම්මා
ගමනක් ගොස්
එන දසුනේ
කලකට පසු ආ
වැස්සට පෙර එන
සුවඳෙන
සුළඟක්
වාගේ

මුදුමඳ සිනාව
මුව රඳවා
ආදරයත් මුසුකර තනනා
බත් පිඬු ටික ටික
ගුළිකරළා
මතකයි අම්මා
මට කැව්වා

හැඟුමන් බර වී
මා සිටිනා විට
අම්මා ඇවිදින්
හිස පිරිමැදි සඳ
මුළු ලොව
මගෙ ළඟ
මට සිතුණා

04.

නිවාඩුව

නිවාඩු දුන්නා අපට නිවාඩු දුන්නා
මේ වාරේ ඉවර වෙලා නිවාඩු දුන්නා
නිවාඩු දුන්නා නිවාඩු දුන්නා
අපට නිවාඩු දුන්නා

අන්න බලන් මාදන් ගස් කථා කරන අයුරු
දැක්කෙ නැද්ද ගෙඩි පිරිච්ච චරම්නියා පඳුරු
දැක්කෙ නැද්ද මිතුරු පලතුරු ඇති අයුරු
දැක්කෙ නැද්ද මිතුරෑ පලතුරු ඇති අයුරු

ගෙම්බො ටිකක් පැන්නා වැවට චන්ඩ කියලා දියනාන්ඩ
යමුද වැවේ දියනාන්ඩ නිවාඩු කාලේ
පීන පීන දිය නාන්ඩ නිවාඩු කාලේ
නිවාඩු කාලේ

ගියවාරෙට වැඩියි මගේ මේ වාරේ ලකුණු
ඒක හින්දා බය නැතුවම ගෙදර යා හැකි
ගෙදර යා හැකි
මට ගෙදර යා හැකි
වීර කමෙන් බය නැතුවම ගෙදර යා හැකි

05.

අපේ සර්

සුභාෂිතය හංසය කවිසිළුමිණය
එන්නෙ අරන් දීමට සිසුනට ශිල්ප
බෙදනාවිට ඒ ශිල්පය සම සමව
ඒ හඬ මිසක් අන්හඬනෑසේ අපට

සුකර නොවන ගැට පද වැල් ලිහිල් කර
සූකිරීවගේ රසකර දුන්නා අපට
එලෙස ලැබූ ශිල්පය සිහිවන කලට
තාමත් සිතින් ඉන්නේ ගුරුතුමා ලඟ

සිසුන් කරන වැරදි දෝෂ දුටුව කල
සැරවෙන්නේ නිවැරදි කෙරුමටයි එය
පෙන්නුවාට ගෝලයින්ට මවා සැර
පිපේ සුවඳ මල් නිතරම ගුරුන් හද

06.

ආදර අරුත

ආධාර ⇨ අදර ⇨ ආදර යයි
උනිඳ පද
ආධාර ⇨ අදර ⇨ ආදරයක් ලැබුනා ද?
අවැසි විටක
ආධාරය ලැබුනු කල
ආදර
අදර
ආධාරය
නොදෙන්නෙද?

07.

ආදර ආකල්ප

ඔබෙ ආදර ආකල්පය
කැමතියි මං අසාඉන්න
එතකොට මට පුළුවන් වෙයි
ඒ විදිහට පෙම් කරන්න

මගෙ ආදර ආකල්පය
කැමතිද ඔබ අසාඉන්න
මං කැමතී ඒ විදිහේ
ආදරයක් ලබාගන්න

ඔබෙත් මගෙත් ආකල්පය
කිමද කියා විමසාලන
කැමති නැද්ද නිසල තැනක
ආදරබර කථා බහට

08.

හීන්නගා

හීන් සැරේ හීන්හඬින් ගීත ඇසෙන්නේ
මල් අතරට මල්මදහස මුසුවී චීන්නේ
සමන් පිච්ච මල්වල ඇති සුවඳ සොයන්නේ
හීන්නගා හීන්සැරේ මොකද කරන්නේ

වෙනදට වැඩියෙන් වරලස හැඩයි දැන් ඇගේ
රහසෙ නැගෙන හසරැල්ලක් තිබේ දැන් මුවේ
ගසුයි වැලුයි මල්පීදි සුවඳ හමන සේ
විටින් විටේ සුවඳ හමයි ලගින් දැන් ඇගේ

හීන් නගයි යෙහෙළියනුයි මී අඹ සෙවනේ
මුකුළු කරයි සිනාසිසී හොරෙන් ම රහසේ
ඒ අතරේ රැඳෙන හිරවී තුරු අතු මුදුනේ
ගීත ගයයි දැන් උන්ගේ වසන්ත කාලේ

09.

කවුද ඔබ

කවුරුදෝ ඔබ
කවුරුදෝ
නොදනිමී මම
නොදනිමි
පුරුදු හැඟුමක්
හදට ගේනා
කවුරුදෝ ඔබ
කවුරුදෝ

ඔබේ කැල්මන් මට වැදී
හදේ දොරගුළු විවරවී
මාව සුළගේ පාවෙලා යනු
දැනී නොදැනී මට දැනේ

ඔබේ අතගෙන යන්නැති
දෑත් පටලා ඉන්නැති
ඔබේ සෙනෙහස විඳ ඇති
ඈත භවයක සසරෙදි

10.

දිව ඔසුව

රෝහලටම ගෙන එනවා සිරිය මිසී
ලෙඩ අඩුවන මුදු බැල්මෙන් බලයි මිසී
සනහන සිත වදන් පෙළක් මුවග ඇතී
ලෙඩ අඩුවන දිව ඔසුවක් තමයි මිසී

කම්මැලි නැති ලැසි ගමනින් ඈ එන්නේ
ලෙඩ අඩුවන කරුණාවෙන් සලකන්නේ
මුවග සිනාමල් නිතරම පූදින්නේ
දැකුමෙන් ඈ ලෙඩේ උනත් අඩුවන්නේ

දවසක් ඈ එන්නත් කටු ගෙන එනවා
මසිත ටිකක් ඒ ගැනනම් බිය වෙනවා
දැකුමෙන් මා ඈ හට එය වැටහෙනවා
විහිළු කරලා එන්නත ඈ මට දෙනවා

සුවය ලබා මාහට ඇත කලක් ගෙවී
එනමුත් සිතයයි තාමත් ළඟට මිසී
රූපෙ හිතේ ඇත තාමත් හොඳට ඇඳී
කොහොම නමුත් හිතවීලා ඇයට වසී

11.

සැසඳීම

බස් රථයේ පා පුවරුවෙ නගිනා විටදී
සැසඳී ආවා හද ඇඳිරූපෙට කුමරී
ප්‍රීති රසේ නංවාලා යන ලෙස ඉතිරී
බැල්මක් හෙළුවා කෝමල තාලෙට සොඳුරී

පැතුම් පොදි බැඳන් හදවත ඇතුළත මාගේ
පැතුම් ඉටුවෙනා සලකුණු සිතට මගෙ දැනේ
කරගන්නට ලැබුනෝතින් ඈ මා භාරී
සන්තෝසෙන් විඳිනට හද පිරිලා යාවී

වැඩි දෙනෙකුගෙ හදවත තුළ විකක් ඇත රැඳී
සහකරු සහකාරී මට මෙලෙස හොඳ හිටී
ඒ ලෙස මා හදේ ඇඳුන පෙම්බර කුමරී
ජීවමාන වී මාගේ ළඟින් දැන් සිටී

12.

කිව නොහැකි ආදරය

කීවොත් දොස් ඇති
කීමට මට බැරි
සොඳුරු පෙමක් ඇති
කවුරුත් දන් නැති
ප්‍රේමවන්තයා මං
ප්‍රේම වන්තයා මං

ඇය මා ඇසුරේ
ගැවසෙන්නේ
එනමුත් ඇය නෑ
එය දන්නේ
මා හද තුළ ඈ
සැත පෙන්නේ
රහසින් සුව මට
ගෙන එන්නේ

ආදරේ කීමට
දහසක් බාධක
ඒ ගැන සිතුමද
සිහිනෙකි මා හට
එනමුත් සොඳුරිය
නුඹට නැගුණු පෙම
හද තුළ තව ඇත
රහසේ සුවදෙන

13.

කළුඈ

මා හද ආදර පියුම නෙළුඈ
ආදර වන්නී ඔබයි කළුඈ
මී පැණි වෑහෙන ලෙසින් බැලූ
ඔබවේ මා හට දැකුම් කලු

ආදරයේ රන් සළුව වියූ
ගෙන එමි ඔබහට කසී සලු
ආදර වන්නී ඔබයි කළුඈ
දැල්ලුව ආදර පහන් සිළු

ආදර වදනින් පවන් සැලූ
ආදර නදියකි මවෙත ගැලූ
සුරකින දෑසින් මදෙස බැලූ
ආදර වන්නී ඔබයි කළුඈ

14.

දඹුලුගල වැනුම

පායන හඳ දඹුලු ගලට වෙනදට වැඩියෙන් හැඩයි
සඳ කැන් වැටි ඔබේ මුණ පිං පාටින් මට පෙනෙයි
හමන සුලඟ දඹුලුගලට සිරුරට සිසිලස ගෙනෙයි
ඔබ අතගෙන නගිනා මට මහන්සියක් නොම දැනෙයි

දඹුලු ගලේ සිරිවිඳ විඳ
දඹුලු ගලට අපි යන කොට
මගේ සිතට කවිසිතිවිලි ගලාන එනවා
මගේ හිතත් හීන් සැරේ සැහැල්ලු වෙනවා

තෙල් අරගෙන මල් අරගෙන බොහෝ දෙනා පැමිණෙති
පිංකරගන බුදුන් නැමඳ දඹුලු ගලෙන් බැස යති
ජීවිත ගිර නගින හැමට දහම් සිසිල ඔසුවකි
තෙල්මල් ගෙන මුනි පිදුමට දඹුලු ගලට එමු අපි

15.

සරසවි පෙම

ලියමු සොඳුරියේ අපි පෙම් ගීයක්
හන්තානට නැඟ එහි මුදුනේ
ආගිය තැන්ගැන පෙම්කළ තැන් ගැන
ලියමුද ගීයේ පද අතරේ

හන්තානට නැඟි ප්‍රේම පුරාණය
එලෙසම ලීවොත් රස අඩුවේ
එබැවින් ඒ තතු ව්‍යාංග අර්තෙන්
මේ ගීයට එක් කරමු අපි

මහවැලි ගංතෙර වින්ද සුපෙම් සුව
කෙලෙසින් ලියමුද ප්‍රිය ළඳුනේ
එනමුත් ලැබුහැටි සරසවි ශිල්පය
අනුප්ප්‍රාසයෙන් ලියමු අපි

හන්තානය මහවැලි තෙර වාගෙම
අප එක්කළ සරසවි මවටත්
අප හද පතුලෙන් තුති පුද ලන්නට
අවසන් පද වෙන්කරමු අපි

16.

තනිවුන විට

තනිවුන විට මා
සොඳුරු වෙලාවක
සිතිවිලි ගෙනියයි
මා ඔබ සමගම
ඔබෙන් වෙන්ව ගෙවූ
මේ දින කීපය
ගෙවී ගියේ
සිය
වසක්ලෙසයි
මට

මියුරු වදන් වැකි
මට ඇසුනා
ඔබේ වදන්
සිත තුළ
ඇසුණා
කරුණාබර අය
හමුවුවා
කරුණා ඔබේ ගුණ
සිහිවුවා

දිනයක දොඩ මලු
යුවලක් දුටුවෙමි
ඔබ සමගින් මා
දොඩ මලු වුයෙමි
සවිදෙන මිනිසුන්
මට හමුවුයෙමි
ඔබේ සවිය
මට
සිහියට ආවෙමි

17.

දුක නිර්වින්දනය වීම

සොයන විට ආදරේ
පැමිණුනා කරදරත්
නමුත් කරදර තුලින්
දුකක් නැත තේරුනේ
වෙනත් වැඩ වලදිනම්
කරදරෙන් දුක තමයි
නමුත් ආදරෙ බලේ
දුකත් නිර්වින්දිතයි

18.

ගුවනට නැඟි පෙම

පද වැලකට ඇති තතු අමුණා
ගීයෙන් ගුවනට එය නංවා
එව්වා ඒමට නොහැකිනිසා
අසනු මැනවි ඔබෙ සවන් යොමා

විශ්වාසේ රන් සළු දවටා
සෙනෙහස් සුවඳැති පැන් ඉසලා
ගෙන ඒ අවමන් අභිමන් විලසින්
සිටින් ඔබේ විමසිල්ල යොමා
සිටින් ඔබේ විමසිල්ල යොමා

ගීයේ ඉඩකඩ අඩුහින්දා
ලීවේ කෙටිකර ඒ හන්දා
කෙටි කර ලීවත් හැඟුමන් හද තුළ
සබඳ ඔබට වේ
පෙම්බර හදවත

19.

බොරු

යසයි යසයි බොරු
එළි නොවනා තුරු
එළි වෙනකොට බොරු
යසට දකී තරු

20.

පල්හිනාව

ඇදගන බොරුව ඔබ දබරෙක ගියාද
නොසොයා ඇත්ත අන්බස පිළිගනීද
ඉටුවුනු පසුව අරමුණු තුටු නොවේද
පල්හිනාව බොරුකළ උන් නොදාද

21.

කන්නලව්ව

ආවෙමි දෙවියනේ මම ඔබ වැඳගන්ඩ
කීවෙමි දෙවියනේ මගෙ දුක අඬුවෙන්ඩ
දෙවියනි එපා සැර දඬුවම් ලැබ දෙන්ඩ
බොරු කළ ඇත්තො එළිකර මට පෙන්නන්ඩ

22.

කලක ඇවෑමෙන්

කලක ඇවෑමෙන් ඈ හමුවූවා
දවසක් නගරේ මං යද්දී
බිළිදෙක් දෑතින් තුරුලෙ හොවාගන
ඈ උන්නා මා නෙත්මානේ

සිනාසුනෙමි මම පෙරදා සිහිවී
මතක පොතේ පිටු අතර රැඳී
විරාගිකව ඈ පිළිතුරු දුන්නා
මුවගේ ඇඳි මුදු සිනාවකින්

පැතුවත් පැතුමන් ඈ හිමි වන්නට
දෛවය නෑ ඉඩදී තිබුනේ
එබැවින් ආවෙමි සමුගෙන ඈගෙන්
අටලෝ දහමින් සිත සනසා

23.

උදහස් නොමවෙන්

උදහස් නොමවෙන් අදහස් විවිධයි
නුබෙ රුව වියකේ බියක් දැනේ
මදහස මිස නුබෙ
උදහස නොපතමි
මා හද බැඳි
මා
සඳවතියේ

සාලිය මාලා පෙම්බැඳි දවසේ
බාධා ඔවුනට නොආවදෝ
පැමිණිය දුක් පැණි රස බව සිතලා
මදහස පා අපි සිනාසෙමු
මදහස පා අපි සිනාසෙමු

කොපමණ බාධා කරදර ආවත්
දැන් අපි අපගේ වෙලා තිබේ
සිතිවිලි කුමටද පහුගිය දේගැන
මදහස පා අපි සිනා සෙමු
මදහස පා අපි සිනා සෙමු

24.

හාමිනේ නෑගම් ගියා

උයා බත් ටික මට තියා
ගියා දරුවොත් පිරිවරා
බලා එන්නට මව පියා
හාමිනේ නෑගම් ගියා

ඉවුබත් අහවර උණා
උයාගැනුමට සිදු උණා
ඉවුමුත් මං වදවෙලා
අනේ ඒ බත් රොස් උණා

දිගයි මහ රෑ හරි දිගයි
දරුවො ඈ නැති රෑ දිගයි
සරණ මඟුලට පෙරදිනේ
මහා රැයටත් වැඩි දිගයි

25.

මචං

නිතර නිතර කථාකරයි
මචං කියලා මට
මිතුරු කමට
නමේ මුලට
මචං කියයි
මට

ඩින්ග ඩින්ග
කතා කරන
ඔහුගෙ දියණි
මට

අමතනවා
නමේ මුලට
මචං කියලා
මට

26.

රාවණා දෙවියෝ

තෙද බලයෙන් දඬුමොනරෙන් ගමන් කළ
වෙද සතරින් රෝගවලට බෙහෙත් කළ
වීණාවෙන් මිහිරිව සිත් පහන් කළ
නමඳිමි දෙවිඳු රාවණ මහ තෙදැති බල

27.

රාවණා රජතුමා

නැගිලා ගුවනට දඬුමොනරේ නැග
දසහිස් බල ඇති රාවණයෝ
කෙරුවා සක්මන් ලක්පුර අහසේ
ධීර වීර මහ නරපතිඳු
ධීර වීර මහ නරපතිඳු

පුලතිසි මහ සෘෂි විශ්වස් මහ සෘෂි
මහ දැනුමැති මහ පරපුරෙහි
මහ බල නිරිඳෙකි මහ පඬි රුවනකි
මහබල ඇති මහ රාවණ යෝ
මහබල ඇති මහ රාවණ යෝ

අර්ක ප්‍රකාශය ඕඩිස තන්ත්‍රය
කුමාර තන්ත්‍රය පොත් ආදී
මහපොත් ලීවා වීණා වැයුවා
වෙද දුරු විදුහුරු රාවණයෝ
වෙද දුරු විදුහුරු රාවණයෝ

28.

ජන මෙහෙවර

ස්ත්‍රී ප්‍රශ්න රාවණ හට පැටෙව්වද
රාවණ පිලේ ජන මෙහෙවර කොතෙක් වෙද
සතුරු පිලේ ජන මෙහෙවර කොතෙක්වෙද
රාවණ තරම් ජන මෙහෙවර කෙරෙව්වද

29.

පුලස්ති සෘෂිතුමා

බෙහෙත් යොදා ගිලන් අයට පිහිට වුණු
නුවණ යොදා සිසු පරපුර බිහි කරපු
දැහැන් වඩා තුන් කාලය ගැන කියපු
නමදිමි දෙවිඳු පුලතිසි සෘෂි මහ ඇදුරු

30.

ඉතිහාසය

ඉතිහාසය
නැවත නැවත සිදුවෙන බැවින්
අනාගතය දැනගනු පිණිස
ඉතිහාසය හදාරමි

ඉතිහාසයේ ආදීනව
දැනගත් බැවින්
අතීත කාමයෙන්
මිදුනෙමි

ඉතිහාසය කෑමට නොහැකිවුවත්
අතීත රසබර තැන්
මනසට රසවත්
අහරකි.

31.

තෘප්තිය

ලොක්කයියා
නියරවල් පිළිවෙළට බඳිමින්
තාලයකට වැඩ කිරීමෙන්
තෘප්තිමත් වන බව පෙනේ

වීරවංශ අයියා
තමා සාදන භාණ්ඩයේ
හැඩවැඩ බලමින්
තෘප්තිමත් වන බව පෙනේ

ඊළඟ අපේ මැතිතුමා
තෘප්තිමත් වන්නේ
ජනතා සේවයෙන්නම්
මොනතරම්
හොඳද ?

32.

රස විඳීම

රස විඳීමට
නොහැකි දේවල්
ඇතිබව සැබෑය
නමුත් සදාචාර ලෙස
රස විඳිය හැකි දේවල්
ලඟ තිබිය දී
ඒවා රස නොවිඳ
ලඟ නොමැති
ලබා ගැනීමට
නොහැකි
දෙයක් ගැන
ළතැවීම
හොඳ ද?

33.

මේකප්

වත්සුනු දවටා උදහස පොදිබැඳි
මේකප් කෙරූ ඔබෙ රුවට වඩා
මදහස පාලා මේකප් නැතිමුත්
දකිනා ඔබෙ රුව ඉතාවටී

උදහස් මුනට මේකප් දාලා
තිබුනට ඒ රුව ලස්සනදෝ
මේකප් නැතිමුත් මදහස ඇති ඔබේ
රූපය කොතරම් ලස්සනදෝ

34.

කලාව

මං හිතන්නේ
කලාව යනු
කළාවූ
ලලිත කලා
ලාලිත්‍ය කළා වූ
චිත්‍ර කලා
චිත්‍රණයක් කළා වූ
අමෘත කලා
අමෘර්තයක්
කළාවූ

35.

අගය

හැඟුම්බරව
රිද්මයකට
ගලායන
ඇතොත්
නමක්
කවි ගීයක්
අගේ
ඇත.

36.

ස්වභාවික සංගීතය

නැවුම් ගීයක්
පාඩම් කළ පසු
නිස්කලංක මොහොතක
ඉබේ ගීතය
මුවින් මිමිනේනම්
සිතින් කියවේනම්
ඒ මොහොතේ
හදවතින් ඇසෙන
සංගීතය
එම සංගීත භාණ්ඩ
එම ගීතය සඳහා
යොදාගත හැකිනම්
එය
ස්වභාවික සංගීතය යැයි
මා සිතමි

37.

නීට් එක

ජපන් වැඩ නීටිය
නීට් ජපනුන් වැඩට කැමතිය
මම නම් නීට් නැත
වැඩට කොහොමත් මගේ හිත නැත

නීට් වීමට සිතුනි දවසක
ගතිම් පියවර නීට් එකටම
වැඩක එක එක කොටස් පිළිවෙළ
නීට් ලෙස මම කරා හෙම්හිට
එකින් එක වැඩ නීට් ලෙස කළ
දැනුනෙ සතුටකි
හදේ පතුලට

මිනිසුන් තුටුලෙස
කරන වැඩවල් කඩිසර
රහස මෙය මද
අගේ දැනුනා
නීට් එකෙ මට

38.

ඔබ විශිෂ්ටයි

බෙත් ගැනුමට අවැසිවූ විට වෙදදුරාණන් විශිෂ්ටයි
ඉගන ගැනුමට අවැසිවූ විට ගුරුතුමාණන් විශිෂ්ටයි
රියක යෑමට අවැසිවූ විට රියදුරාණන් විශිෂ්ටයි
ඔබේ සේවය අවැසිවූ විට ඔබ තුමාණන් විශිෂ්ටයි

39.

මිනිස්සු

ඔබ තුළ නානා විඳ මිනිසුන් සිටියත්
ඔබ තුළ සිටින
සොඳුරු සෞන්දර්ය මිනිසාට
මා ඉතා
ප්‍රිය කරමි

40.

උයමන

රයිස් කුකර්වල බත් ටික ඊවාට
ඇලුමිනියම් වළදක් ළිප තැබුවාට
ගෑස් එකේ මාළු පින්න ඉදුනාට
මගෙ ඡන්දය මැටි වළඳට දර ළිපට

41.

සියපත

පැහැබර උදේ මා ගමනක් ගියපු විට
දින මෙහෙවරට සැරසී යන ඔබව දැක
සුපිපුනු ගමන් දකිනා සියපතක් ලෙස
නුඹෙ රුව දුටිමි ඒ සියපත ලෙසින් මම

42.

ඉල්ලීම

හැදෙන ගහ දෙපෙත්තෙන් පේනවලු
චුතවෙන්න ඉන්න දෙවියන්ගෙ මල්මාලා පරවෙනවලු
වැස්සට කලින් ඇටිකුබ්බො කෑගහනවලු

පහුගිය කාලේ
සතෙකුගෙ නමක් කියලා
බැනපු චික්තරා මහත්තයෙක්
දිනලත් පැරදුනා කියලා
කටකතා ගියා

පහුගිය කාලේ
තමන්ගෙ තත්වෙට
ගැලපෙන්නෙ නැති කථා කීව
මැතිතුමෙක්
නිතර නිතර
පරදින්න ගත්තා
නමුත් චුතුමා
පස්සෙ පස්සෙ
තත්වෙට ගැලපෙන්න කථා කළා
පස්සෙ චුතුමා දිනුවා

කලින් හොඳින් කථා කරපු
බලගතු මැතිතුමෙක්
පස්සෙ පස්සෙ
ආවේග ශීලීව කථා කළා
පස්සෙ චුතුමා පැරදුනා

කථාවට දක්ෂ
චික්තරා මැතිතුමෙක්
ආවේග ශීලීව
නිතර නිතර මඩගහන්න ගත්තා
පස්සෙ චතුමට
හොඳ මඩපාරක් වැදුනා

මම අපේ මැතිතුමාගෙනුත්
නොකියා ඉල්ලන්නෙ
ආවේග ශීලීව කථා නොකර
සතුන්ගෙ නම් කියලා බනින් නැතුව
තමන්ගෙ තත්වෙට නොගැල පෙන කථා කියන් නැතුව
අනුන්ට මඩගහන් නැතුව
කථා කරන්න කියලා

බැරි වෙලා හරි
මගේ මැතිතුමත්
එහෙම කරන්ඩ ගියොත්
ආප්ප කාලා
කෝපිබීලා
පක්ෂෙන් ආපු
මැතිතුමාවාගේ
මමත්
හෙම්හිට අයින් වෙනවා

43.
ඇමති තුමන් වෙත

ඇමති තුමනි
මම ඔබතුමන්ට
පරණ කරත්තෙ
යන්න කියන්නෑ

ඒත් ඇමතිතුමනි
පරණ දේවල් වලත්
ගොඩක් හොඳ දේවල්
තියනවා නේද ?

පරණ එළවළු පලතුරු ගැන
අලුත් එළවළු පළතුරු ගැන
අපි දෙන්නම
දන්නවා

පරණ දේවල්වල
අස්වැන්න අඩුයි කීවට
අලුත් දේවල් වල නැති
ගොඩක් හොඳ දේවල්
පරණ දේවල්වල
තියනවා නේද ?

ඒක නිසා
ඇමති තුමනි
පරණ එළවළු පලතුරු ගැන
නැවත හිතුවොත්
මොකද?

44.

පෙරමඟ නිමිති

සමහරු පෙරමඟ නිමිති
විශ්වාස කරති
සමහරු විශ්වාස නොකරති
මගේ අවධානය
විශ්වාස කරන අය වෙතයි
හමුවුයේ ශුභ නිමිත්තක් නම්
වැඩෙත් සාර්ථක නම්
ශුභ නිමිත්තට අප්‍රමාණව
ප්‍රශංසා කරයි
හමුවුයේ අශුභ නිමිත්තක් නම්
වැඩෙත් අසාර්ථක නම්
අශුභ නිමිත්තට
අප්‍රමාණව බැණවදී
නිමිති පහළ වූයේ
පවට හෝ පිනට නම්
නැති නම් වාසනාවට හෝ
අවාසනාවට නම්
ඒත් නැතිනම්
වෙනත් හේතුවකට නම්
හමුවූ නිමිත්තට
ප්‍රසංසා කිරීම හෝ
බැණවැදීම
කෙතරම්
සාධාරණ ද?

45.

හිස්ටීරියාව

සැබෑ ලෙඩ මායා ලෙඩ
රෝග ඇත ළඟින් ළඟ
හැඳිනීම සියුම් ලෙස
කළ යුතුය වෙදකමට

භූතයක් ලෙඩ වලට
ඇතද නැත මායාව
හැඳිනීම සියුම් ලෙස
කළ යුතුය වෙදකමට

46.

ක්ෂණික කෝපය

රියදුරු පුහුණුව ලද මම
අවශ්‍ය තැනදී
අවශ්‍ය විදිහට
ටිකින් ටික
තිරිංග පාගන අයුරු
ඉගන ගතිම්

දැන් අවශ්‍ය තැනදී
අවශ්‍ය විදිහට
ක්ෂණිකව සිදුවේ

එහෙත් එය
ක්ෂණිකව වූයේ
මා ලද
පුහුණුව නිසාමය

මා තුළ ඇති
ක්ෂණික කෝපයත්
නොදැනුවත්
නොසැලකිල්ල මත
ටිකින් ටික සිදුවූ
පුහුණුවක් බව සිතේ

47.

යොමුවීම

ඉතා අමාරුවෙන් වමනේ දම දමා
හොරෙන් හොරෙන්
මත්පැනට යොමුවූ මම
මත්පැනට
ඇබ්බැහිවී
සිටියෙමි

මත්පැන් හොඳ නැතිබව දැනගත් මම
කැහැ කැහැ
හොරෙන් හොරෙන්
දුමට ඇබ්බැහිවී සිටියෙමි

දුම්පානය හොඳ නැතිබව දැනගත් මම
විටක මත්වී
කැරකි කැරකී
බුලත් කෙල හලාගන
විෂ බුලත් විටට
ඇබ්බැහිවී
සිටියෙමි.

විෂ බුලත් විටේ ආදීනව දැනගත් මම
එක තැන
අමාරුවෙන්
එහාට මෙහාට ඇඹරෙමින්
ටිකින් ටික
කියව කියවා
කියවුම් රසයට
හුරුවීමි

දැන් මගේ ඊළඟ අරමුණ
ටිකින් ටික
භාවනාමය රස
සොයා යෑමයි.

48.

අභිභවා යෑම

පව් සිදුවන නිසාත්
දේව උදහසට ලක්වන බැවිනුත්
සදාචාර විරෝධී බැවිනුත්
මම ඔබට
පීඩා කිරීමෙන්
වැළකෙමි

මට ඉහළ සිටීමට ඇති
ආසාව නිසා
ඔබව පහත හෙළීමේ අරමුණින්
මා දන්නා
ශිල්ප තුළින්
සදාචාර සම්පන්නව
මම ඔබ
අභිභවා ගියෙමි.

සමහර තැන්වලදී
ඔබ මට අභිභවා ලීමට
නොහැකි කල
මම රහසින්
දුක් උනෙමි

කෙටිකලක් තුළ
මගේ සහජ හැකියාවන්
ඔබට අභිභවා ලීමට
නොහැකි තැනුත්
ඔබේ සහජ හැකියාවන්
මට අභිභවා ලීමට
නොහැකි තැනුත්
ඇතිබව
පසක් කළෙමි

දැන් මා
කටයුතු කරන්නේ
ඔබව තළා පෙළීමටවත්
අභිභවා ලීමටවත්
නොව
මගේ අවශ්‍යතා
සපුරා ගැනීමේ
අරමුණෙනි
ඒ නිසා
ඔබ මා
අභිභවා ගියද
පෙර සේ
දුක් නොවෙමි.

49.
ලදදෙයින් දුක්වීම සහ ලදදෙයින් තුටුවීම.

කෑම මට හොඳ මදී
අහල පහලට වඩා
ඒ ගැනම සිත සිතා
දුක් උනෙමි
දුක් උනෙමි

වේල පිරිමහ ගන්න
වෙහෙසෙනා අයෙකු දැක
මට ලැබුණු කෑම ගැන
තුටු උනෙමි
තුටු උනෙමි

ඔහුගෙ රිය මිල වැඩී
මගේ රියටත් වඩා
ඒ ගැනම සිත සිතා
දුක් උනෙමි
දුක් උනෙමි

පාවහන් පයට නැති
පයින් යන අයෙකු දැක
මටම ඇති රථය ගැන
තුටු උනෙමි
තුටු උනෙමි

මගේ ගේ හොඳ මදී
ඔහුගෙ නිවසට වඩා
ඒ ගැනම සිත සිතා
දුක් උනෙමි
දුක් උනෙමි

දුටුවිටදි යනෙන අය
කුළී නිවසක් සොයා
මටම ඇති නිවස ගැන
තුටු උනෙමි
තුටු උනෙමි

50.

අනිත්‍යයේ සැප දුක

අනිත්‍යයි සැප පසක් කරලා
ආදරේ වෙන් වී ගියා
අනිත්‍යයි දුක් පසක් කරමින්
යලිත් ආදරේ හිමිළනා

අනිත්‍යයි සැප පසක් කරමින්
නොසිතූ බාධක පැමිණියා
අනිත්‍යයි දුක් පසක් කරමින්
නොසිතූ ලෙස පැන විසඳුනා

අනිත්‍යයි සැප නොසිතලා
පැන්නා මං උඩ පැන්නා මං
අනිත්‍යයි දුක නොසිතලා
දුක්ඨනා මං දුක්ඨනා

51.
කුල උච්ච මානය සහ කුලහීන මානය

අතීත පරපුරේ
දොස් ඇතිතැන්
දැකීමෙනුත්
වර්තමාන
පරපුරේ
දොස් ඇතිතැන්
දැකී මෙනුත්
කුල උච්චමාන
සිතිවිල්ලට
කුමක්
සිදුවේ ද ?
අතීත පරපුරේ
යහ ඇහිමන්
දැකීමෙනුත්
වර්තමාන
පරපුරේ
යහ ඇහිමන්
දැකීමෙනුත්
කුලහීනමාන
සිතිවිල්ලට
කුමක්
සිදුවේද ?

52.

සුන්දර අසුන්දර

මරණය සුන්දර බව යැයි කීවොත්
පිළිගන්නෙද ඔබ මා හැඟුමන්
පෙරකල මරණය අවැසිව සිටි මට
මරණේ සුන්දර බව දැණුනා

අසුන්දරයි මා මරණය කීවොත්
පිළිගන්නෙද ඔබ මා හැඟුමන්
අවැසිව නෑමට අද දින මරණය
එබැවින් මරණය අසුන්දරයි

53.

නොදුන් අයිතිය

මුදලක් දුන්නෙම් අත පෑ යාචකට
ඉන්පසු දුටුවෙ දුම්වැටියක් ගෙන මුවට
පසු තැවි තැවී සිටියා මං දුන්දේට
දුන්නත් සිතින් අයිතිය මං නොදුන්නට

54.

මගේමද

මගේ කියා කීවත් මං මගේ පුතු
බිරිඳ කියයි මගේ පුතුට මගේ පුතු
දියණි කියයි මගෙ අයියා කියා ඔහු
නෑයො කියයි අපෙ නෑයෙකි කියා ඔහු
මගෙම කියලා හිතුවත් මං මගේ පුතු
මටම නොවේ අන් අයටද අයිති පුතු

ඉඩම මගේ සින්නක්කර අයිති මට
වරිපනමින් සභාවටද අයිති ඇත
අපේ කියයි මගෙ ඉඩමට දරුවො ඇය
මටම නොවන මගෙ ඉඩමක් තිබේ මට

55.

මටමද

වේදනාවෙන්
කෙඳිරුනු
මා හට
මට මය
හැඟුමක්
මට සිතුනා
එනමුත්
කෑ ගැසූ
ඔබ ගැන
දුටු විට
මට මය
හැඟුමෙන්
මං
මිදුනා

56.

සිත් අහස

මටම වේය මෙය
මටම වේය මෙය
හැඟුමක් තිබුනත් සිත් අහසේ
එනමුත් බැසයයි
ඇතිබව තව අය
දහමින් දුටුවම මේ ලෝකේ

කිසා ගෝතමී අඹමිට සොයලා
ගෙයින් ගෙයට යන අතර තුරේ
දහමින් දැකලා
සෝදුක් නිවිලා
හදවත සැනසී යන්න ඇති

සිටිනා මොහොතක සතුටේ කැලඹී
පිරිසක් මාහට හමුවුයේ
ඔවුනගෙ ජය ගැන මා අසනාවිට
මගේ උදම් රළ සන්සිඳුනේ

57.

දුකගේන සිතිවිල්ල

දුක ගේන සිතිවිල්ලෙ ඇලි ඇලී දුක්වෙමුද
දුක ගේන සිතිවිල්ලෙ ගැටි ගැටී දුක්වෙමුද
දුක ගේන සිතිවිල්ල දුකක් බව නොසිතේද
දුක ගේන සිතිවිල්ල මඟ ඇරලා යමුනේද

58.

සසර දුක

කසාවතක් හැඳ වටාපතක්ගෙන
වඩිනා හිමියනි මහවනයේ
සසරේ දුක දැක කල කිරිලාදෝ
බුදු පුතෙකුන් වී මහණ වුණේ

සිටුවා ඇත්තෙමි අඹ පැලයක්
සිටුවා ලැබුවේ මා සතුටක්
එහි ඵල මා ලැබ
ගස ලොකු වනු දැක
තිබුනේ හදවත පිරි සතුටක්

ඒ ඵල රැකුමට
ඒ ගස හැදුමට
ගත්තේ අපමණ මා වෙහෙසක්
ඒ නමුත් දවසක මහවරුසාවට
අඹගස ඉදිරී බිම වැටුනේ

හිමියනි අඹගස මුල් කරගන මා
ආස්වාදයන් ලැබුවට වැඩියෙන්
ලැබූ ආදීනව වැඩිබව සිතුණා
ඒ ලෙස සිතිල ද
මෙදියත ගැන ඔබ
කසාවතක් හැඳ
මහණ වුණේ

59.

ජය ශ්‍රී මහා බෝධිය

සරණයි සරණයි
සම්දුන් සරණයි
ජය ශ්‍රී මහ බෝ සම්දුන් සරණයි
පිහිටයි පිහිටයි මහ රැක වරණයි
මහ බෝ සම්දුගේ මහරැක වරණයි

ජම්බුද්දීපේ හටගත්බෝධිය
දෙව් ප්‍රිය රජුදා වැඩමුබෝධිය
වසර දහස් කල් නැමදු බෝධිය
නමදිමු නමදිමු ශ්‍රී මහබෝධිය

තිසා වැවේ වැව් සුලඟ හමන්නේ
ඒ සුලඟට බෝපත් සෙල වෙන්නේ
මුලු ලක් දෙරණට සිසිල සදන්නේ
ශ්‍රී මහ බෝධිය අපි නමදින්නේ

60.

මොණරාගල සමාධි පිළිමය

නිවනා දනමන වැඩෙනා හදබැති
දුටුවම මොණරාගල පිළිමේ
නමදිමු බැතියෙන් රම්බඩගල්ලේ මොණරාගල පිරිවෙනෙ පිළිමේ
මොණරාගල මහ බුදු පිළිමේ

කරුණා බැතිබර මිනිසුන් එක්වී නෙළුවා සමාධි බුදු පිළිමේ
නමදිමු නිවනට පිවිසෙන සිතැතිව
මොණරාගල පිරිවෙනෙ පිළිමේ
මොණරාගල මහ බුදු පිළිමේ

සමාධියට සිත නංවන සිතැතිව
සමාධි පිළිමය අබියසදි
මොහොතක් වත් ඉමු භවුන් වඩා අපි
බුදු ගුණ සිහියට නංවාලා
බුදු ගුණ සිහියට නංවාලා

61.

අන්තිම කැමැත්ත

යම් කිසි දාක මෙලොවින් මට තුරන් වෙළා
යන්නට උනොත් ඔබගෙන් මට දුරස්වෙළා
එදිනට අපේ මල් මතකය අවදි වෙළා
එන්නට එපා නෙතගට ඔබෙ කඳුලු ගලා

දුකට ගැයෙන ගී කිසිවක් ගැයෙන් නෙපා
සොහොන් කොතක් මා වෙනුවෙන් තැනෙන්නෙපා
මං නැති තනිය කිසිලෙසකට දැනෙන්නෙපා
ඔබෙ හදවතේ දුක්බර තනු වැයෙන්නෙපා

කඳුළු ඔබේ දෙනෙත් වලින් ගලා ගියොත්
මං නැති තනිය යම්ලෙසකට දැනී ගියොත්
ඔබෙ හදවතේ දුක්බර තනු වැයී ගියොත්
එතකොට හොදා ත්‍රිලකුණු සිහියට නැගුවොත්